පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

බලශක්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා
සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල් විෂයභාර
අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන
පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் 79

நிறுவனத்தின் பெயர். வலுசக்தி அமைச்சு

*பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை
தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிதி எனும்
விடயத்திற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும்
மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும்
பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.
அஇஉஎக்பமதநடனறளஏஐஊஈஔஓஒவஙலரயநரூஸ்ஷெஃஎ[கக*

Parliamentary Series No 79

Name of the institution: Energy Ministry

**Submission of observations of Hon. Minister in charge of the subject of Finance and
actions taken with regard to the reports tabled by the Committee on Public Accounts in
terms of Standing Order No. 119(4)**

රාජ්‍ය ආයතන, පළාත් සභා පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය

මගින් ඇගයීම - 2022 මුදල් වර්ෂය සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79

ආයතනයේ නම - බලශක්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය (විදුලිබල අංශය)

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම්
01	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම	➢ 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2021.12.15 දිනට පෙර කඩිනමින් එවන ලෙස දැනුවත් කරමින් 2021.12.03 වන දින අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අමාත්‍යාංශයේ අභ්‍යන්තර අංශ වෙත ලිපි යොමු කර ඇත. ➢ කෙටුම්පත් කරන ලද සම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්ම ලේකම්තුමාගේ අනුමැතියට 2021.12.29 වෙනි දින යොමු කරන ලදී. ➢ කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලේකම්තුමාගේ උපදෙස් පරිදි සියළුම මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පවත්වා එහි දී ගනු ලබන තීරණයක් අනුව අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමේ ක්‍රියාකාරකම් පැහැදිලිව හඳුනා ගැනීමට හැකි වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරන ලෙස සියළුම අංශ හා ආයතන වෙත දන්වන ලදී. ➢ ඒ අනුව ජනන සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ අංශය හැර අනෙකුත් අංශයන්ගෙන් හා ආයතන වලින් ලබා ගත් තොරතුරු වලට අනුකූලව නැවත යාවත්කාලීන කරන ලද සම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්ම 2022.04.08 වෙනි දින ලේකම්තුමාගේ අනුමැතියට යොමු කොට අනුමැතිය ලබා ගන්නා ලදී. සිදු කරන ලද සංශෝධන හේතුවෙන් 2022.04.08 දක්වා අමතර කාලයක් මේ සඳහා වැය විය.
02	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබීම	2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම 2021.12.15 දින සකස් කර ඇත. (ඇමුණුම 01)

03	සැලසුම් කළ පුහුණු අවස්ථා අතරින්, ලබා දුන් පුහුණු අවස්ථා ප්‍රමාණය 50% අඩු විය	➢ 2022 වර්ෂයේ දී ප්‍රතිපාදන අපේක්ෂාවෙන් නිලධාරී පුහුණු වැඩසටහන් සැලසුම් කළද, 2022 වර්ෂය සඳහා නිලධාරී පුහුණුව සඳහා 2401 විෂය අංකය යටතේ කිසිදු ප්‍රතිපාදනයක් වෙන්වී නොමැත. එබැවින් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. ➢ තවද, අංක PS/SB/Circular/10/2022 හා 2022.08.15 දිනැති ජනාධිපති චක්‍රලේඛය මගින් ලබා දී ඇති ප්‍රතිපාදනවලට පරිබාහාරව වියදම් නොකළ යුතු බවද දන්වා ඇත. ➢ එමෙන්ම එකළ පැවති කොරෝනා වසංගත තත්ත්වය සැලසුම් කළ පුහුණු අවස්ථා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය. ➢ ඉහත හේතූන් මත සැලසුම් කළ පරිදි නිලධාරී පුහුණු කිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි විය.

ඉංජිනේරු කුමාර ජයකොඩි
බලශක්ති අමාත්‍ය

රාජ්‍ය ආයතන, පළාත් සභා පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79

ආයතනයේ නම - බලශක්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය (බලශක්ති අංශය)

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම
01	අවදානම් ලේඛනය යාවත්කාලීන පදනමක් මත පවත්වාගෙන ගොස් නොතිබීම.	2022 වර්ෂයේ සිට සෑම වර්ෂයක් සඳහාම අවදානම් ලේඛනය සකස් කර යාවත්කාලීනව පවත්වාගෙන යයි.
02	රජය සතු මෝටර් රථවලට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මූල්‍ය රෙගුලාසිවලට අනුව පියවර ගෙන නොතිබීම.	➢ දෛනික ධාවන සටහන් පත්‍ර හා මාසික සාරාංශ සටහන් පත්‍ර රජයේ විගණන අංශය වෙත යොමු කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

අනු අංකය	වාහන අංකය	අලාභය (රු)	ප්‍රගතිය
1	KJ - 6282	1,603.68	මු.රෙ.109 ප්‍රකාරව දැනටමත් අලාභ පොත් වලින් කපා හැර ඇත.
2	PF - 5094	16,000.00	මු.රෙ.109 ප්‍රකාරව දැනටමත් අලාභ පොත් වලින් කපා හැර ඇත.
3	PE - 9461	23,352.24	මු.රෙ.109 ප්‍රකාරව දැනටමත් අලාභ පොත් වලින් කපා හැර ඇත.
4	CAF - 5016	1,170.70	මු.රෙ.109 ප්‍රකාරව දැනටමත් අලාභ පොත් වලින් කපා හැර ඇත.
5	PA - 1700	8,000.00	මු.රෙ.109 ප්‍රකාරව දැනටමත් අලාභ පොත් වලින් කපා හැර ඇත.
6	KL - 9507	627,009.56	අලාභය මේ වනවිටත් වාරික වශයෙන් ගෙවමින් පවතී. ඒ අනුව තවත් රු. 306,526.00 ක මුදලක් ගෙවීමට ඉතිරිව තිබේ.
7	KF - 1999	61,402.61	ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා නීතිපති උපදෙස් ඉල්ලා තිබේ.
8	PF - 5094	24,200.00	මු.රෙ.109 ප්‍රකාරව දැනටමත් අලාභ පොත් වලින් කපා හැර ඇත.
9	CAF - 5016	40,362.93	මේ වන විට රු. 10,052.01 ක මුදලක් පියවා ඇති අතර ඉතිරි රු. 30,310.92ක මුදල සමාන මාසික වාරික 6කින් ගෙවීමට එකඟ වී ඇත.
10	KR - 5515	73,019.27	මු.රෙ.109 ප්‍රකාරව දැනටමත් අලාභ පොත් වලින් කපා හැර ඇත.
11	PF - 5094	60,300.00	ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා නීතිපති උපදෙස් ඉල්ලා තිබේ

03	සැලසුම් කළ පුහුණු අවස්ථා අතරින්, ලබා දුන් පුහුණු අවස්ථා ප්‍රමාණය 50% අඩු විය.	➢ 2022 වර්ෂයේ දී ප්‍රතිපාදන අපේක්ෂාවෙන් නිලධාරී පුහුණු වැඩසටහන් සැලසුම් කළද, 2022 වර්ෂය සඳහා නිලධාරී පුහුණුව සඳහා 2401 විෂය අංකය යටතේ කිසිදු ප්‍රතිපාදනයක් වෙන්වී නොමැත. එබැවින් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. ➢ තවද, අංක PS/SB/Circular/10/2022 හා 2022.08.15 දිනැති ජනාධිපති චක්‍රලේඛය මඟින් ලබා දී ඇති ප්‍රතිපාදනවලට පරිබාහාරව වියදම් නොකළ යුතු බවද දන්වා ඇත. ➢ එමෙන්ම එකළ පැවති කොරෝනා වසන්ගත තත්ත්වය සැලසුම් කළ පුහුණු අවස්ථා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය. ඉහත හේතූන් මත සැලසුම් කළ පරිදි නිලධාරී පුහුණු කිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි විය.
04	විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම.	➢ **තනතුරු පුරප්පාඩු** • එහි සඳහන් කර තිබූ තනතුරු පුරප්පාඩුවලින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)තනතුර හැර අනෙකුතු සියලුම පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. ඉහත පුරප්පාඩුව අමාත්‍යාංශයට අත්‍යාවශ්‍ය තනතුරක් බැවින් නිලධාරීන් ලබා දෙන ලෙස MOE/ADM/HR/2/5/6/(V) අංක 2025.10.02 දිනැති ලිපියෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. ➢ **2.1 ආදායම් කළමණාකරණය** • 2023 වර්ෂයේ ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි, එවකට තිබූ සියලුම බලපත්‍ර ගාස්තු එනම් ලිහිසි තෙල්, තාර, නැව් තෙල්, ජෙට් ඒ 1 සඳහා වූ බලපත්‍ර ගාස්තු (2023 වර්ෂය සඳහා වූ අයවැයෙහි අන්තර්ගත 35.1 වන යෝජනාවට අනුව 2020 සිට 2022 දක්වා වසර 03 ක කාලයක් තුළ සංශෝධනය නොකළ ගාස්තු හා අය කිරීම් 20% කින් ඉහළ දැමීම ක්‍රියාත්මක කිරීම යටතේ) 20% කින් ඉහළ දමන ලදී. • ඛනිජ තෙල් නිෂ්පාදනය මෙරටට ආනයනය, බෙදා හැරීම හා සැපයීම යන කාණ්ඩය යටතේ සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගමට හා ආර්.එම්.පාර්ක්ස් සමාගමට නව බලපත්‍ර නිකුත් කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ සිට ආයතන හතරකින් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන දෙකක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කරන ලදී.

- එමෙන්ම 2023 වර්ෂයේ අවසන් අර්ධ වර්ෂයේ සිට මෙරට ලිහිසි තෙල් ආනයනය,අපනයනය,විකිණීම,සැපයීම,බෙදා හැරීම සඳහා බලපත්‍ර 10 ක්ද නිකුත් කරන ලදී. එමඟින් අර්ධ වාර්ෂික රු.21,360,000 ක මුදලක් අය කරගනු ලැබේ.

- තවද, ගුවන් යානා ඉන්ධන (ජෙට් ඒ1) වෙළදාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කර පෞද්ගලික ආයතන දෙකක් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරන ලදී. ඒ සඳහා වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වශයෙන් එක් ආයතනයකින් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 10,000 අය කරන ලදී.

- ලිහිසි තෙල්, තාර, නැව් තෙල් හා ගුවන් යානා ඉන්ධන (ජෙට් ඒ 1) වැනි ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා මෙතෙක් ප්‍රතිපත්තිමය රාමුවක් නොතිබුණු අතර මේ වන විට මෙම නිෂ්පාදන සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමට අදාළ කටයුතු සිදු වෙමින් පවතී. ඒ අනුව, ඉදිරියේදී මෙම නිෂ්පාදන සම්බන්ධ කාර්යයන් විධිමත් ආකාරයෙන් සිදු කිරීමේ හැකියාව ලැබෙන අතර ඒ මඟින් ආදායම ද වැඩිකර ගත හැකිවේ.

➢ **3.2 කාර්යයන් ඉටු නොකිරීම**

ඉන්ධන සැපයීමේ ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති වැඩසටහන් සකස් කිරීම හා පසු විපරම් කිරීමේ කටයුතු අමාත්‍යාංශය මඟින් ඉටු කරනු ලබන අතර, අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 3 වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය යන ආයතන 3 විසින් අදාළ විෂය පථයන් යටතේ ව්‍යාපෘති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. එහෙත් ලංකා ඉන්දියානු තෙල් සමාගමට අදාළ කටයුතු එම සමාගම විසින්ම ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා ඍජුව මැදිහත් වීමේ අවස්ථාව මෙම අමාත්‍යාංශයට නොමැත. කෙසේ වුවද ලංකා ඉන්දියානු තෙල් සමාගමත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය යන ආයතන වලටත් එමෙන්ම 2023 වසරේදී ස්ථාපිත කරන ලද සිනොපෙක් හා ආර්.එම්. පාර්ක්ස් යන ආයතන 2 ට ද අදාළ ජාතික මට්ටමෙන් නියාමන කටයුතු මෙම අමාත්‍යාංශය මඟින් සිදු කෙරේ. එහෙත් බලශක්ති විෂය භාර අමාත්‍යාංශය මඟින් එම නියාමන කටයුතු වඩාත් විධිමත්ව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් හා සම්පත් නොමැති බැවින් එම කටයුතු තවදුරටත් සාර්ථකව සිදු කිරීම සඳහා ස්වාධීන නියාමන ආයතනයක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. එවැනි ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් අදාළ ජාතික මට්ටමේ තීරණ ගැනීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

➢ **3.3 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම**

මුතුරාජවෙල සිට බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපල දක්වා ගුවන් යාන ඉන්ධන ප්‍රවාහන නල මග ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දෙවන වරට ලංසු කැඳවීමේ කටයුතු සිදු කරන ලද අතර ලංසු 2025 නොවැම්බර් 14 දින විවෘත කරන ලදී. කැබිනට් කමිටුව මගින් අනුමත කරන ලද ප්‍රසම්පාදන කාල රාමුව අනුව මෙහි ඇගයීමේ කටයුතු අවසන් කර කොන්ත්‍රාත් ප්‍රදානය 2026

		අප්‍රේල් මස සිදුකිරීමට නියමිත අතර මෙහි ඉදිකිරීම් කටයුතු 2028 ඔක්තෝබර් පමණ වන විට සිදු කිරීමට නියමිත වේ. ➤ **3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්** (අ) තවදුරටත් මෙම ව්‍යාපෘතියට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. ඉඩම් හිමියන් සම්බන්ධ පරීක්ෂණ සිදු කර අවසන් කර ඇත. අදාළ වාර්තාව සැකසීමේ කටයුතු සිදු කරමින් පවතී. (ආ) අක්කර 5 ඉඩම් විමර්ශනය කර ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අක්කර 18 ඉඩමේ විමර්ශන කටයුතු සිදු කර ඇති අතර ඉඩම් හිමියන් සම්බන්ධ පරීක්ෂණ ද සිදු කර අවසන් කර ඇත. අදාළ වාර්තාව සැකසීමේ කටයුතු සිදු කරමින් පවතී. (ඇ) 2022.03.24 දින M/s Prime Engineering වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. මේ අතර, කොන්ත්‍රාත්කරු මිල ඉහළ දැමීමක් ඉල්ලා ඇති අතර මිල ඉහළ දැමීමේ කමිටුවේ සහ ඉංජිනේරු ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ නිර්දේශය සමඟ යෝජිත මිල ඉහළ දැමීම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ අනුව, අභ්‍යන්තර පාවෙන වහලයන් සැපයීම හා ස්ථාපන සිදු කර සහ අළුත්වැඩියා කටයුතු සිදු කර ව්‍යාපෘතිය නිම කරන ලදී. ටැංකි අංක 04, 2023.11.17 වන දින ද ටැංකි අංක 05, 2024.04.06 වන දින ද නිමකර මෙහෙයුම් කටයුතු සඳහා භාර දෙන ලදී. (ඈ) මෙම ව්‍යාපෘතිය, රට හරහා දිවෙන නල මාර්ග ව්‍යාපෘතිය (Cross Country Pipeline Project) ලෙස 2022 අප්‍රේල් මස සිට 2023 අප්‍රේල් මස දක්වා කාලය තුළ සිදු කිරීමට නියමිතව තිබුණ ද ඉන්පසුව රට තුළ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හිටුවන ලදී. නැවත ඒ වෙනුවට "කොලොන්නාව තොග ගබඩා පර්යන්තයේ සිට කොළඹ වරාය දක්වා ගමන් කරන නල මාර්ගය" (KHPP) ඉදිකිරීමේ ව්‍යාපෘතිය අරඹන ලදී. KHPP ව්‍යාපෘතිය (Kolonnawa to Harbor Pipeline Project) සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය 2025.11.17 දින ලැබුණු අතර ඒ සඳහා අවශ්‍ය වන ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කරමින් පවතී.
05	සියලුම රාජ්‍ය නිලධාරීන් තම වත්කම් හා වගකීම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම.	2022 වර්ෂයේ මාණ්ඩලික නිලධාරීන් 08 දෙනෙකු වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර තිබුණි.

ඉංජිනේරු කුමාර ජයකොඩි
බලශක්ති අමාත්‍ය

Annex 01

Ministry of Power
15 DEC 2021
Planning Division

Internal Memo

From : Additional Secretary (Admin & Procurement)

To : Director General (Planning)

Subject : Procurement Plan - 2022

File No : PE/AD/02/Pro. Plan/Budget Doc. - 2022

Date : 15.12.2021

This refers to your internal memo dated 03.12.2021 on the above matter.

Accordingly, I am sending herewith the Procurement Plan - 2022 for necessary action please.

15/12/21

Ministry of Power
Procurement Plan - 2022

Administration and Establishment Services

Rs "000

Programme/Activity		Budget Estimates (Rs.'000)	Q1			Q2			Q3			Q4		
			J	F	M	A	M	J	J	A	S	O	N	D
Supplies	Stationery and Office Requisities	7,000	900			1,350			2,250			2,500		
Acquisition of Capital Assets	Furniture & Office Equipment	500	-			200			-			300		
	Plant, Machinery & Equipment	500	-			200			-			300		

Prepared By :- W.A.D.S.D Chamara
Development Officer

Checked By :- L.G.T. Kumari
Development Officer

Authorized By :- D.P. Wickramasinghe
Additional Secretary

Approved By :- Wasantha Perera
Secretary

Wasantha Perera
Secretary
Ministry of Power

Coppies :- 1. Public Service Commission, Secretary
2. Auditor Deneral's Department, Auditor Deneral
3. Department of Public Finance, Director General

Ministry of Power
Procurement Plan - 2022

Minister's Office

Rs "000

Programme/Activity		Budget Estimates (Rs.'000)	Q1			Q2			Q3			Q4		
			J	F	M	A	M	J	J	A	S	O	N	D
Supplies	Stationery and Office Requisities	750	100			150			250			250		
Acquisition of Capital Assets	Furniture & Office Equipment	800	-			400			-			400		
	Plant, Machinery & Equipment	1,200	200			200			600			200		

Prepared By :- W.A.D.S.D Chamara
Development Officer

Checked By :- L.G.T. Kumari
Development Officer

Authorized By :- D.P. Wickramasinghe
Additional Secretary

Approved By :- Wasantha Perera
Secretary

Copies :- 1. Public Service Commission, Secretary
2. Auditor Deneral's Department, Auditor Deneral
3. Department of Public Finance, Director General

Wasantha Perera
Secretary
Ministry of Power